# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2304/48 - 2022 නොවැම්බර් මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2022.11.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය :* ME/ACQ/F 824.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/8/2016/PC/468.

කොළඹ මහා නගර සභාවට අයත් පාමංකඩ නැගෙනහිර පිහිටි විජිත පාර පුළුල්කර සංවර්ධනය කිරීම සඳහා පහත විස්තර කර ඇති ඉඩම් කොටස් රජයට පවරා ගෙන ඇති බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*අත්කර ගැනීමට නියමිත ඉඩම් පිළිබඳ විස්තරය :*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොළඹ මහා නගර සභා සීමාව තුළ පිහිටි පාමංකඩ නැගෙනහිර පිහිටි සර්වේ ජනරාල් විසින් 2022.04.09 වන දින සහතික කරන ලද අංක කො 9986 දරන මූලික පිඹුරේ අංක 1-5 වශයෙන් පිළියෙල කර ඇති හෙක්ටයාර් 0.0176 වන පහත විස්තර කර ඇති ඉඩම් කැබලි 5.

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: වරිපනම් අංක 776 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත; විස්තරය: ගෙවත්ත; මුල් හිමිකම් පාන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: පර්චස් 3.8

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: -; විස්තරය: මාර්ගය; මුල් හිමිකම් පාන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: පර්චස් 0.4

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: වරිපනම් අංක 13/4 විජිත පාර; විස්තරය: ගෙවත්ත; මුල් හිමිකම් පාන්නා: රෝහිණී මේරි වර්ජිනිය ද සිල්වා (මියගොස් ඇත), අංක 13/14 විජිත පාර, පාමංකඩ; ප්‍රමාණය: පර්චස් 1.0

04. **කැබලි අංක 04**
ඉඩමේ නම: වරිපනම් අංක 748, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත; විස්තරය: ගෙවත්ත; මුල් හිමිකම් පාන්නා: ගාමිණී වික්‍රමසිංහ අංක 748 හැව්ලොක් පාර, පාමංකඩ; ප්‍රමාණය: පර්චස් 0.6

05. **කැබලි අංක 05**
ඉඩමේ නම: වරිපනම් අංක 127, වේළුවනාරාම පාර; විස්තරය: ගෙවත්ත; මුල් හිමිකම් පාන්නා: ක්‍රිෂ්ණපිලෛ




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මයිල්වානම්, අංක 127 වේළුවනාරාම පාර, පාමංකඩ; ප්‍රමාණය: පර්චස් 1.2

ඉහත සඳහන් ඉඩම් ගැන උනන්දුවක් දක්වන සියලු දෙනා පුද්ගලිකව හෝ නිසි පරිදි බලය පවරන ලද නියෝජිතයින් මගින් 2022.10.21 වැනි දින පෙ.ව. 10.00 ට කොළඹ මහා නගර සභා කොමසාරිස් කාර්යාලයේ දී මා ඉදිරියේ පෙනී සිටිය යුතු බවත්, එම ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ උනන්දුව දැක්වීමේ ස්වභාවය ද, එකී ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් වන්දි ඉල්ලා සිටීමේ විස්තර ද, වන්දි ප්‍රමාණය ගැන විස්තරද 2022.10.14 වැනි දින හෝ ඊට ප්‍රථම මා වෙත ඉදිරිපත් කළ යුතු ය.

ඔවුන්ගේ හිමිකම් සම්බන්ධයෙන් සියලු ඔප්පු හා අනිකුත් ලියවිලි ද පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

ජේ. එම්. හඳාණි ජයවර්ධන,
කොළඹ මහා නගර සභාව සහ
කොළඹ මහා නගර සභා බල සීමාව
තුළ ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.

2022 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ 07, නගර ශාලාව
නාගරික කොමසාරිස් කාර්යාලයේ දී ය.

EOG 09-0051

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.